**රබර් පාලන අරමුදල**
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මතය
---------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට රබර් පාලන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
----------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

භෞතිකව නොපවත්නා රු.985,925 ක්වූ වත්කම් අයිතම 07 ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

එකතුව රු.652,775 ක්වූ ජංගම වත්කම් ශේෂ 13 ක් හා එකතුව රු.239,784 ක් වූ ජංගම බැරකම් ශේෂ 05 ක වර්ෂ 08 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.
-------------------------------------

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ණය සහන සහා අරමුදල | 130,328 | විස්තරාත්මක උපලේඛන , ශේෂ සනාථ කිරීම් |
| (ආ) | අත්තිකාරම් ගිණුම් 6 කට අදාල ශේෂ | 287,379 | පැහැදිලි කිරීමේ සටහන් |
| (ඇ) | රබර් වෙළඳ ලේඛන තොග | 6,360 | තොග ලේඛන |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ගෙවිය යුතු අත්තිකාරම් | 222,031 | විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් |
| (ඉ) | අනෙකුත් ජංගම වගකීම් | 17,753 | ශේෂ සනාථ කිරීම් |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය ලෙස රු.463,652 ක අතිරික්තයක් දැක්වූ අතර, ඉකුත් වර්ෂයේ එය රු.275,280 ක් වූයෙන් අතිරික්තයේ වැඩිවීම රු.188,372 ක් විය. කෙසේ වෙතත් අරමුදලේ මුළු ආදායම ස්ථාවර තැන්පතු පොලී හා ඉතුරුම් තැන්පතු පොලී ආදායමෙන් පමණක් සමන්විත වූ අතර, එය පිළිවෙලින් රු.347,199 ක් සහ රු.147,686 ක් විය.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

ක්‍රියාකාරීත්වයේ නොපවතින රබර් පාලන අරමුදල ඇවර කිරීම පිණිස අදාල පනතේ විධි විධාන අනුව සකස් කළ ගිණුම් වාර්තාවේ වත්කම් හා වගකීම් නිරවුල් කර එයට විගණකාධිපතිගේ එකඟතාවය ලබා ගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද 2011 ඔක්තෝබර් 21 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණි.

### 3.2 අයවැය පාලනය

අරමුදල යටතේ වියදම් දැරීමක් සිදු නොවන බැවින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළයෙල කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ